# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1725/16 — 2011 සැප්තැම්බර් 29 වැනි බ්‍රහස්පතින්දා - 2011.09.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### බස්නාහිර පළාතේ පළාත් සභාව

1989 අංක 12 දරන පළාත් සභා ආනුශාංගික විධිවිධාන පනතේ 2 වැනි වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තිය යටතේ කරනු ලබන නිවේදනය

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තියෙහි සඳහන් විධිවිධාන අනුව බස්නාහිර පළාතේ, පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වශයෙන් මවිසින් සම්පාදනය කරනු ලැබූ මෙහි පහත දැක්වෙන අතුරු ව්‍යවස්ථා ඉහත කී වගන්තිය යටතේ ම මෙසේ ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ප්‍රසන්න රණතුංග,
බස්නාහිර පළාතේ, පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය හා
මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන,
පළාත් පාලන හා පළාත් පරිපාලන, විදුලිබල හා බල ශක්ති,
මිනිස්බල හා රැකී රක්ෂා සහ
ආර්ථික ප්‍රවර්ධන පිළිබඳ අමාත්‍ය.

2011 සැප්තැම්බර් මස 19 වැනි දින,
කොළඹ 07, ශ්‍රාවස්ති මන්දිරයේ පිහිටි,
බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍යාංශයේ දී ය.

### නගර සභා සීමාව තුළ වාහන නවතා තැබීම සඳහා ස්ථාන ඇති කිරීම සහ වාහනවලින් ගාස්තු අය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

01. මේ අතුරු ව්‍යවස්ථාව නගර සභා බල ප්‍රදේශය ඇතුළත වාහන නතර කර තැබීම සඳහා ස්ථාන ඇති කිරීම සහ ඒ ස්ථානවල වාහන නවතා තැබීම වෙනුවෙන් ගාස්තු අය කිරීම සහ වාහන නවතා තැබීම පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හඳුන්වනු ලැබේ.

02. මෙහි මින් මතු සභාපතිවරයා වශයෙන් හඳුන්වනු ලබන නගර සභාවේ සභාපතිවරයා බල ප්‍රදේශය ඇතුළත වාහන නතර කර තැබීම හෝ නතර කර තැබීම තහනම් කරන හෝ සීමා කරන නැතහොත් පාලනය කරන යම් වීථියක, වීථියක කොටසක වාහන සඳහා වෙන්කර ඇති යම් වාහන නතර කිරීමේ ස්ථානයක් සඳහන් කරන දැන්වීමක් ඒ වීථියෙහි නැතහොත් වීථියෙහි කොටසක ප්‍රකට ස්ථානයක සිට පෙනෙන ආකාරයකට ප්‍රදර්ශනය කරනු ලැබිය යුතු ය.

1A - PG 001293— 390 (2011/09)

03. දෙවැනි අතුරු ව්‍යවස්ථාවෙහි දක්වා ඇති දැන්වීමක් මගින් වාහන නතර කිරීම හෝ නතර කිරීම තහනම් කරනු ලැබ ඇති අවස්ථාවක වාහනයක රියැදුරු විසින් –

(අ) කිසියම් නිලධාරියෙකු හෝ බලධාරියෙකු විසින් ඒ වීථියෙහි හෝ වීථියෙහි කොටසෙහි ඉදි කරනු ලැබ ඇති හෝ ප්‍රදර්ශනය කරනු ලැබ ඇති කිසියම් වාහන සංඥාවකට හෝ දැන්වීමකට අනුකූලව ක්‍රියා කිරීමේ; හෝ

(ආ) ඒ වීදියෙහි කොටසෙහි ඒ අවස්ථාවේ පවත්නා කිසියම් වාහන ගමනාගමනයකට පිළිවෙල නිසි පරිදි අනුගමනය කිරීමේ; හෝ

(ඇ) කිසියම් තැනැත්තෙකුට එම වාහනයෙන් බැසීමට හෝ එම වාහනයට ගොඩ වීමට ඉඩ දීමේ; හෝ

(ඈ) එම වාහනයට බඩු පැටවීමේ හෝ ඒ වාහනයෙන් බඩු බෑමේ හෝ කාර්යය සඳහා අවශ්‍ය කාලයක් හැර එම වාහනය වීදියේ හෝ වීදියෙහි කොටසෙහි නතර කර තැබීම නොකළ යුතු ය.

04. සභාපතිවරයා විසින් මෙම අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරන ලද වලංගු අවසර පත්‍රයක් තමා සන්තකයෙහි ඇත්නම් මිස කිසියම් තැනැත්තෙකු විසින් වාහන නතර කර තැබීම සඳහා වෙන්කර ඇති ස්ථානයක වාහනයක් නවතා තැබීම නොකළ යුතු ය.

05. 04 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරනු ලබන එක් එක් අවසර පත්‍රය සඳහා සභාව විසින් යෝජනා සම්මතයක් මගින් තීරණය කොට *ගැසට් පත්‍රයෙහි* පළ කරනු ලබන ගාස්තු ප්‍රමාණයක් අය කරනු ලැබිය යුතු ය.

06. රජයේ දෙපාර්තමේන්තුවක් හෝ සංස්ථාවක් සංස්ථාගත නොවූ පුද්ගල මණ්ඩලයක් විසින් හෝ සභාවක් විසින් කලින්කලට නියම කරනු ලබන මාසික ගාස්තු හෝ වාර්ෂික ගාස්තු සභාව වෙත ගෙවනු ලැබීමෙන් අවස්ථාවෝචිත පරිදි ඒ දෙපාර්තමේන්තුවට හෝ පුද්ගල මණ්ඩලයට හෝ පුද්ගලයෙකුට අයත් මෝටර් වාහන සඳහා මාසික හෝ වාර්ෂික අවසර පත්‍රයක් ලබා ගත හැකිය.

07. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරනු ලබන සෑම අවසර පත්‍රයක් ම එය නිකුත් කරනු ලැබුවේ යම් මෝටර් වාහනයක් වෙනුවෙන් ද යන්න, එම මෝටර් වාහනය හැඳින්වීමේ අංකය සඳහන් විය යුතු අතර, එය අවසර පත්‍රයෙහි සඳහන් කාල සීමාව සඳහා පමණක් වලංගු විය යුතු ය.

08. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ අවසර පත්‍රයක් ලබා ගන්නා සෑම තැනැත්තෙක් විසින් ම එම අවසර පත්‍රය වාහනයෙන් පිටතට පෙනෙන පරිදි වාහනය තුළ ප්‍රකටව පෙනෙන ස්ථානයක ප්‍රදර්ශනය කළ යුතු ය.

09. පොලිස් නිලධාරියෙකු හෝ රථ වාහන පාලකයෙකු විසින් වාහන නතර කර තැබීමේ පොදු ස්ථානයක නතර කර ඇති යම් මෝටර් වාහනයක අයිතිකරුගෙන් නැතහොත් රියැදුරුගෙන් එම මෝටර් වාහනය වෙනුවෙන් නිකුත් කර ඇති වාහන නවතා තැබීමේ අවසර පත්‍රය පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිනු ලැබූ කිනම් අවස්ථාවක වුව ද, ඒ අවසර පත්‍රය එම අයිතිකරු හෝ රියැදුරු විසින් ඉදිරිපත් කළ යුතු ය.

10. කිසියම් වාහන නතර කර තැබීමේ පොදු ස්ථානයක කිසියම් නිශ්චිත පන්තියක හෝ වර්ගයක හෝ මෝටර් වාහන සඳහා වෙන් කරනු ලැබූ අවස්ථාවක කිසියම් තැනැත්තෙකු විසින් එම පන්තියට හෝ වර්ගයට අයත් නොවන මෝටර් වාහනයක් එහි නතර කර තැබීම නොකළ යුතුය.

11. වාහන නතර කර තැබීමේ පොදු ස්ථානයකට ඇතුළුවන හෝ ඉන් පිටව යන හෝ වෙනත් මෝටර් වාහනයකට බාධා වන ආකාරයකට කිසිම තැනැත්තෙක් විසින් වාහන නතරකර තැබීමේ පොදු ස්ථානයක මෝටර් වාහනයක් නතර කරනු නොලැබිය යුතු ය.

12. වාහන නතර කර තැබීම සඳහා වෙන් කර ඇති පොදු ස්ථානයක ඇතුළුවීම හා පිටවීම සඳහා වෙනම මාර්ග සලසා ඒ බව දැන්වීමක් හෝ සංඥා පුවරුවක් මගින් දක්වා ඇති අවස්ථාවක නියමිත මාර්ගයෙන් හැර කිසිම මෝටර් වාහනයක් එම ස්ථානයට ඇතුළුවීම හෝ පිටවීම නොකළ යුතු ය.

13. දම්වැල් හෝ කුළුනු හෝ දම්වැල් කුළුනු යන දෙවර්ගය ම සපයා ඇති පොදු නැවතුම්පොළක නතර කරනු ලබන මෝටර් වාහන සියල්ලම ඒවා පැමිණි අනුපිළිවෙල අනුව එකිනෙක පිටුපසින් එකම පැත්තට මුහුණ ලා නතර කර තැබිය යුතු ය.

14. මෝටර් වාහන නතරකර තැබීමේ පොදු ස්ථානයක මෝටර් වාහනයක් නතරකර තිබියදීම කිසිම තැනැත්තෙකු විසින් එම වාහනය සේදීම/සේදීමට සැලැස්වීම නොකළ යුතු ය.

15. කිසිම තැනැත්තෙකු විසින් වාහනය නතර කර තැබීමේ පොදු ස්ථානයක වාහනය ඉවත් කර ගැනීමේ කාර්ය සඳහා අළුත්වැඩියාවක් කිරීමක් අත්‍යාවශ්‍ය වන්නේ නම් මිස වාහනය නතරකර තැබීමේ පොදු ස්ථානයක නතර කර තබා ඇති මෝටර් වාහනයක කිසිම අකාරයකට අළුත්වැඩියාවක් කරනු නොලැබිය යුතු ය.

16. මෙම අතුරු ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීම පිළිබඳව, ඒ උල්ලංඝනය ස්ථාපිත වන යම් එක් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් සඳහා රුපියල් 750කට නොවැඩි දඩයකින්, ඒ උල්ලංඝනය නොකඩවා තව දුරටත් කරගෙන යන විටක නිසි බලය ඇති අධිකරණයක් විසින් ඒ පිළිබඳව වරදකරු කිරීමෙන් පසුව හෝ එම උල්ලංඝනය ගැන අවධානය යොමු කරමින් සභාපතිවරයා විසින් හෝ බලයලත් වෙනත් නිලධාරියෙකු විසින් ලිඛිත දැන්වීමක් බාර දෙනු ලැබීමෙන් පසුව උල්ලංඝනය තවදුරටත් නොකඩවා කර ගෙන යන සෑම එක් දිනක් සඳහාම රුපියල් 250ට නොවැඩි අතිරේක දඩයකට ද යටත් විය යුතු ය.

17. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මෙම අතුරු ව්‍යවස්ථාවල "සභාපතිවරයා" යන්නෙන් නගර සභාවේ සභාපතිවරයා අදහස් වේ.

"පොලිස් නිලධාරියා" යන්නෙන් පොලිස් පරීක්ෂක නිලයට පහළ නිලයක් දරන ශ්‍රී ලංකා පොලිස් සේවයේ පොලිස් නිලධාරියෙකු අදහස් වේ.

"රථ වාහන පාලක" යන්නෙන් පොදු නතර කිරීමේ ස්ථානයක මෝටර් වාහන නතරකර තැබීම සඳහා සභාපතිවරයා වෙනුවෙන් අවසර පත්‍ර නිකුත් කිරීමට සභාපතිවරයා විසින් බලය පවරනු ලැබූ පුද්ගලයකු අදහස් වේ.

"මෝටර් වාහනයක්" යන්නෙන් මාර්ගවල පාවිච්චි කිරීම සඳහා සකස් කරන ලද යාන්ත්‍රිකව බලය සපයන යම් වාහනයක් අදහස් වේ.

"වාහන නවතා තැබීමේ පොදු ස්ථානය" යන්නෙන් නගර සභාවේ යෝජනා සම්මුතියක් මගින් නම් කරනු ලබන ස්ථානයක් අදහස් වේ.

10-325/1

---

**බස්නාහිර පළාතේ පළාත් සභාව**

## 1989 අංක 12 දරන පළාත් සභා ආනුශාංගික විධිවිධාන පනතේ 2 වැනි වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තිය යටතේ කරනු ලබන නිවේදනය

1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමග කියවිය යුතු 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තියෙහි සඳහන් විධිවිධාන අනුව බස්නාහිර පළාතේ, පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයා වශයෙන් මවිසින් සම්පාදනය කරනු ලැබූ මෙහි පහත දැක්වෙන අතුරු ව්‍යවස්ථා ඉහත කී වගන්තිය යටතේ ම මෙසේ ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ප්‍රසන්න රණතුංග,
බස්නාහිර පළාතේ, පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය හා
මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන,
පළාත් පාලන හා පළාත් පරිපාලන, විදුලිබල හා බල ශක්ති,
මිනිස්බල හා රැකී රක්ෂා සහ
ආර්ථික ප්‍රවර්ධන පිළිබඳ අමාත්‍ය.

2011 සැප්තැම්බර් මස 19 වැනි දින,
කොළඹ 07, ශ්‍රාවස්ති මන්දිරයේ පිහිටි,
බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍යාංශයේ දී ය.

**ප්‍රාදේශීය සභා සීමාව තුළ වාහන නවතා තැබීම සඳහා ස්ථාන ඇති කිරීම සහ වාහනවලින් ගාස්තු අය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව**

01. මේ අතුරු ව්‍යවස්ථාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත වාහන නතරකර තැබීම සඳහා ස්ථාන ඇති කිරීම සහ ඒ ස්ථානවල වාහන නවතා තැබීම වෙනුවෙන් ගාස්තු අයකිරීම සහ වාහන නවතා තැබීම පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හඳුන්වනු ලැබේ.

02. මෙහි මින් මතු සභාපතිවරයා වශයෙන් හඳුන්වනු ලබන ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා බල ප්‍රදේශය ඇතුළත වාහන නතර කර තැබීම හෝ නතර කර තැබීම තහනම් කරන හෝ සීමා කරන නැතහොත් පාලනය කරන යම් වීථියක, වීථියක කොටසක වාහන සඳහා වෙන් කර ඇති යම් වාහන නතර කිරීමේ ස්ථානයක් සඳහන් කරන දැන්වීමක් ඒ වීථියෙහි නැතහොත් වීථියෙහි කොටසක ප්‍රකට ස්ථානයක සිට පෙනෙන ආකාරයකට ප්‍රදර්ශනය කරනු ලැබිය යුතුය.

03. දෙවැනි අතුරු ව්‍යවස්ථාවෙහි දක්වා ඇති දැන්වීමක් මගින් වාහන නතර කිරීම හෝ නතර කිරීම තහනම් කරනු ලැබ ඇති අවස්ථාවක වාහනයක රියැදුරු විසින් –

(අ) කිසියම් නිලධාරියෙකු හෝ බලධාරියකු විසින් ඒ වීථියෙහි හෝ වීථියෙහි කොටසෙහි ඉදි කරනු ලැබ ඇති හෝ ප්‍රදර්ශනය කරනු ලැබ ඇති කිසියම් වාහන සංඥාවකට හෝ දැන්වීමකට අනුකූලව ක්‍රියා කිරීමේ; හෝ

(ආ) ඒ වීදියෙහි කොටසෙහි ඒ අවස්ථාවේ පවත්නා කිසියම් වාහන ගමනා ගමනයකට පිළිවෙල නිසි පරිදි අනුගමනය කිරීමේ; හෝ

(ඇ) කිසියම් තැනැත්තෙකුට එම වාහනයෙන් බැසීමට හෝ එම වාහනයට ගොඩ වීමට ඉඩ දීමේ; හෝ

(ඈ) එම වාහනයට බඩු පැටවීමේ හෝ ඒ වාහනයෙන් බඩු බෑමේ හෝ කාර්යය සඳහා අවශ්‍ය කාලයක් හැර එම වාහනය වීදියේ හෝ වීදියෙහි කොටසෙහි නතර කර තැබීම නොකළ යුතු ය.

04. සභාපතිවරයා විසින් මෙම අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරන ලද වලංගු අවසර පත්‍රයක් තමා සන්තකයෙහි ඇත්නම් මිස කිසියම් තැනැත්තෙකු විසින් වාහන නතර කර තැබීම සඳහා වෙන් කර ඇති ස්ථානයක වාහනයක් නවතා තැබීම නොකළ යුතු ය.

05. 04 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ නිකුත් කරනු ලබන එක් එක් අවසර පත්‍රය සඳහා සභාව විසින් යෝජනා සම්මතයක් මගින් තීරණය කොට ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන ගාස්තු ප්‍රමාණයක් අය කරනු ලැබිය යුතු ය.

06. රජයේ දෙපාර්තමේන්තුවක් හෝ සංස්ථාවක් හෝ සංස්ථාගත නොවූ පුද්ගල මණ්ඩලයක් විසින් හෝ සභාවක් විසින් කලින් කලට නියම කරනු ලබන මාසික ගාස්තු හෝ වාර්ෂික ගාස්තු සභාව වෙත ගෙවනු ලැබීමෙන් අවස්ථාවෝචිත පරිදි ඒ දෙපාර්තමේන්තුවට හෝ පුද්ගල මණ්ඩලයට හෝ පුද්ගලයකුට අයත් මෝටර් වාහන සඳහා මාසික හෝ වාර්ෂික අවසර පත්‍රයක් ලබා ගත හැකිය.

07. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරනු ලබන සෑම අවසර පත්‍රයක් ම එය නිකුත් කරනු ලැබුවේ යම් මෝටර් වාහනයක් වෙනුවෙන් ද යන්න, එම මෝටර් වාහනය හැඳින්වීමේ අංකය සඳහන් විය යුතු අතර, එය අවසර පත්‍රයෙහි සඳහන් කාල සීමාව සඳහා පමණක් වලංගු විය යුතු ය.

08. මෙම අතුරු ව්‍යවස්ථා යටතේ අවසර පත්‍රයක් ලබා ගන්නා සෑම තැනැත්තෙක් විසින් ම එම අවසර පත්‍රය වාහනයෙන් පිටතට පෙනෙන පරිදි වාහනය තුළ ප්‍රකටව පෙනෙන ස්ථානයක ප්‍රදර්ශනය කළ යුතු ය.

09. පොලිස් නිලධාරියකු හෝ රථ වාහන පාලකයකු විසින් වාහන නතර කර තැබීමේ පොදු ස්ථානයක නතර කර ඇති යම් මෝටර් වාහනයක අයිතිකරුගෙන් නැතහොත් රියැදුරුගෙන් එම මෝටර් වාහනය වෙනුවෙන් නිකුත් කර ඇති වාහන නවතා තැබීමේ අවසර පත්‍රය පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිනු ලැබූ කිනම් අවස්ථාවක වුව ද, ඒ අවසර පත්‍රය එම අයිතිකරු හෝ රියැදුරු විසින් ඉදිරිපත් කළ යුතු ය.

10. කිසියම් වාහන නතර කර තැබීමේ පොදු ස්ථානයක කිසියම් නිශ්චිත පන්තියක හෝ වර්ගයක හෝ මෝටර් වාහන සඳහා වෙන් කරනු ලැබූ අවස්ථාවක කිසියම් තැනැත්තෙකු විසින් එම පන්තියට හෝ වර්ගයට අයත් නොවන මෝටර් වාහනයක් එහි නතර කර තැබීම නොකළ යුතුය.

11. වාහන නතර කර තැබීමේ පොදු ස්ථානයකට ඇතුළු වන හෝ ඉන් පිටව යන හෝ වෙනත් මෝටර් වාහනයකට බාධා වන ආකාරයකට කිසිම තැනැත්තෙක් විසින් වාහන නතර කර තැබීමේ පොදු ස්ථානයක මෝටර් වාහනයක් නතර කරනු නොලැබිය යුතු ය.

12. වාහන නතර කර තැබීම සඳහා වෙන් කර ඇති පොදු ස්ථානයක ඇතුළුවීම හා පිටවීම සඳහා වෙනම මාර්ග සලසා ඒ බව දැන්වීමක් හෝ සංඥා පුවරුවක් මගින් දක්වා ඇති අවස්ථාවක නියමිත මාර්ගයෙන් හැර කිසිම මෝටර් වාහනයක් එම ස්ථානයට ඇතුළුවීම හෝ පිටවීම නොකළ යුතු ය.

13. දම්වැල් හෝ කුළුනු හෝ දම් වැල් කුළුනු යන දෙවර්ගයම සපයා ඇති පොදු නැවතුම්පොළක නතර කරනු ලබන මෝටර් වාහන සියල්ලම ඒවා පැමිණි අනුපිළිවෙල අනුව එකිනෙක පිටුපසින් එකම පැත්තට මුහුණ ලා නතර කර තැබිය යුතු ය.

14. මෝටර් වාහන නතර කර තැබීමේ පොදු ස්ථානයක මෝටර් වාහනයක් නතර කර තිබිය දී කිසිම තැනැත්තෙකු විසින් එම වාහනය සේදීම/සේදීමට සැලැස්වීම නොකළ යුතු ය.

15. කිසිම තැනැත්තෙකු විසින් වාහනය නතර කර තැබීමේ පොදු ස්ථානයක වාහනය ඉවත් කර ගැනීමේ කාර්ය සඳහා අළුත් වැඩියාවක් කිරීමක් අත්‍යාවශ්‍ය වන්නේ නම් මිස වාහනය නතර කර තැබීමේ පොදු ස්ථානයක නතර කර තබා ඇති මෝටර් වාහනයක කිසිම ආකාරයකට අළුත්වැඩියාවක් කරනු නොලැබිය යුතුය.

16. මෙම අතුරු ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීම පිළිබඳව, ඒ උල්ලංඝනය ස්ථාපිත වන යම් එක් ක්‍රියාවක් හෝ නොකර හැරීමක් සඳහා රුපියල් 750 කට නොවැඩි දඩයකින්, ඒ උල්ලංඝනය නොකඩවා තව දුරටත් කර ගෙන යන විටක නිසි බලය ඇති අධිකරණයක් විසින් ඒ ඒ පිළිබඳව වරදකරු කිරීමෙන් පසුව හෝ එම උල්ලංඝනය ගැන අවධානය යොමු කරමින් සභාපතිවරයා විසින් හෝ බලයලත් වෙනත් නිලධාරියකු විසින් ලිඛිත දැන්වීමක් බාර දෙනු ලැබීමෙන් පසුව උල්ලංඝනය තවදුරටත් නොකඩවා කර ගෙන යන සෑම එක් දිනක් සඳහාම රුපියල් 250ට නොවැඩි අතිරේක දඩයකට ද යටත් විය යුතුය.

17. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මෙම අතුරු ව්‍යවස්ථාවල "සභාපතිවරයා" යන්නෙන් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා අදහස් වේ.

"පොලිස් නිලධාරියා" යන්නෙන් පොලිස් පරීක්ෂක නිලයට පහළ නිලයක් දරන ශ්‍රී ලංකා පොලිස් සේවයේ පොලිස් නිලධාරියකු අදහස් වේ.

"රථවාහන පාලක" යන්නෙන් පොදු නතර කිරීමේ ස්ථානය මෝටර් වාහන නතර කර තැබීම සඳහා සභාපතිවරයා වෙනුවෙන් අවසර පත්‍ර නිකුත් කිරීමට සභාපතිවරයා විසින් බලය පවරනු ලැබූ පුද්ගලයකු අදහස් වේ.

"මෝටර් වාහනයක්" යන්නෙන් මාර්ගවල පාවිච්චි කිරීම සඳහා සකස් කරන ලද යාන්ත්‍රිකව බලය සපයන යම් වාහනයක් අදහස් වේ.

"වාහන නවතා තැබීමේ පොදු ස්ථානය" යන්නෙන් ප්‍රාදේශීය සභාවේ යෝජනා සම්මුතියක් මගින් නම් කරනු ලබන ස්ථානයක් අදහස් වේ.

10-325/02

---

## කළුතර ප්‍රාදේශීය සභාව

### 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 123 (1) වැනි වගන්තිය යටතේ පළ කරනු ලබන නිවේදනය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 (vii) ඌ වැනි උපවගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 122 වැනි වගන්තියෙන් කළුතර ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර එකී ප්‍රාදේශීය සභාව විසින් සාදනු ලැබ, මෙහි පහත දැක්වෙන අතුරු ව්‍යවස්ථාව, 2008 මාර්තු මස 04 දින පැවති කළුතර ප්‍රාදේශීය සභා රැස්වීමේ අංක 1 දරන සභා රැස්වීමෙන් සම්මතය ලබා ඇත. 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමග කියවිය යුතු ඉහත කී ප්‍රාදේශීය සභා පනතේ 123 (1) වැනි වගන්තිය ප්‍රකාර එකී අතුරු ව්‍යවස්ථාව බස්නාහිර පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය හා මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, විදුලිබල හා බල ශක්ති, මිනිස්බල හා රැකී රක්ෂා සහ ආර්ථික ප්‍රවර්ධන පිළිබඳ අමාත්‍ය ප්‍රසන්න රණතුංග වන මා විසින් අනුමත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ප්‍රසන්න රණතුංග,
බස්නාහිර පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය හා
මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන,
පළාත් පාලන හා පළාත් පරිපාලන, විදුලිබල හා බල ශක්ති,
මිනිස්බල හා රැකී රක්ෂා සහ
ආර්ථික ප්‍රවර්ධන පිළිබඳ අමාත්‍ය.

2011 සැප්තැම්බර් මස 13 වැනි දින,
කොළඹ 07, ශ්‍රාවස්ති මන්දිරයේ පිහිටි,
බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍යාංශයේ දී ය.

**ත්‍රිරෝද රථ නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා**

01. මේ අතුරු ව්‍යවස්ථා කළුතර ප්‍රාදේශීය සභාවේ ත්‍රිරෝද රථ නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව යනුවෙන් හඳුන්වනු ලැබේ.

02. මේ අතුරු ව්‍යවස්ථා සභා බල ප්‍රදේශය තුළ ත්‍රිරෝද රථ නවතා තැබීම, විධිමත් කිරීම, පාලනය කිරීම හා නවතා තැබීමේ ස්ථාන සඳහා ගාස්තු අය කිරීම සඳහා පනවනු ලැබේ.

03.(1) සභා බල ප්‍රදේශය තුළ ත්‍රිරෝද රථ නවතා තැබිය යුතු ස්ථානයේ නවතා තැබිය යුතු උපරිම ත්‍රිරෝද රථ සංඛ්‍යාව සභාවේ යෝජනා සම්මුතියක් මඟින් නිශ්චය කළ යුතු අතර එම තීරණ ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දිනයේ සිට හෝ එහි සඳහන් කරනු ලබන නිශ්චිත දිනක හෝ සිට ක්‍රියාත්මක වන්නේය.

03.(2) ඉහත 03.1 ව්‍යවස්ථාව අනුව නිශ්චය කළ ත්‍රිරෝද රථ නවතා තබන ස්ථාන හා සංඛ්‍යාව සංශෝධනය කළ යුතු යැයි සභාවට හැඟී යන්නේ නම් සභා සම්මුතියක් මඟින් එසේ කළ හැකි අතර, එය ගැසට් පත්‍රයේ පළ කළ දිනක සිට හෝ එහි සඳහන් නිශ්චිත දිනයක හෝ සිට ක්‍රියාත්මක වන්නේය.

03.(3) ත්‍රිරෝද රථ නැවතුම් පොළ ස්ථාන නිශ්චය කිරීම, එහි පරාසයන් තීරණය කිරීම හා නතර කළ හැකි උපරිම ත්‍රිරෝද රථ සංඛ්‍යාව තීරණය කිරීම සඳහා හෝ එම තීරණ සංශෝධනය සඳහා පළමුවැනි උපලේඛනයේ සඳහන් අයගෙන් සමන්විත කමිටුවක නිර්දේශ සභාව විසින් ලබා ගත යුතුය.

03.(4) ඉහත 3(1) ව්‍යවස්ථාව අනුව ත්‍රිරෝද රථ නවතා තැබිය යුතු ස්ථාන හඳුනා ගැනීම පිණිස වන පුවරුවක් සෑම නැවතුම් පොළක ඉදිරිපිට සවිකළ යුතු වන අතර, එම පුවරුවේ අදාළ නැවතුම්පොළේ සංකේත අංකය ප්‍රදර්ශනය කළ යුතුය.

3 (2) ව්‍යවස්ථාව අනුව නැවතුම් පළක නවතා තැබිය හැකි උපරිම ත්‍රිරෝද රථ සංඛ්‍යාව අදාළ පුවරුවේ ප්‍රදර්ශනය කළ යුතුය.

03.(5) නැවතුම් පොළෙහි ත්‍රිරෝද රථ ක්‍රමානුකූලව නවතා තැබිය යුතු අතර, නවතා තැබිය යුතු ආකාරය සභාවේ බලයලත් නිලධාරියකු විසින් පළල අඟල් 04ක් වූ සුදු හෝ කහ පැහැති රේඛාවක් මඟින් සලකුණු කර තිබිය යුතුය.

04. ප්‍රාදේශීය සභාව විසින් ත්‍රිරෝද රථ නවතා තැබීම පිණිස මෙම අතුරු ව්‍යවස්ථාවේ දෙවැනි උපලේඛනයේ සඳහන් ආකාරයේ බලපත්‍රයක් සභාපතිවරයා විසින් නිකුත් කිරීම හා ඒ සඳහා ගාස්තු පනවා අය කිරීම නීත්‍යානුකූල වන්නේය.

05. ත්‍රිරෝද රථ නැවතුම් පොළෙක නවතා තබන ත්‍රිරෝද රථ බලපත්‍රය ලබා දීමේ දී නැවතුම් පොළට ආසන්නතම පදිංචිකරුවන්ට අයත් ත්‍රිරෝද රථවලට ප්‍රමුඛත්වය ලබා දිය යුතුය.

06.(1) තුන්වැනි උපලේඛනයේ සඳහන් ආදර්ශ අයදුම් පත පරිදි තම ස්ථිර පදිංචියට ආසන්නතම ත්‍රිරෝද රථ නැවතුම්පොළෙහි නවතා තැබීම සඳහා ප්‍රාදේශීය සභාවෙන් බලපත්‍රයක් ඉල්ලුම් කළ යුතු අතර ඒ සඳහා අයදුම් පත්‍රය රු. 50ක මුදලක් ගෙවා සභාවෙන් ලබා ගත යුතුය. මෙම අයදුම් පත්‍ර ගාස්තුව සභාව විසින් ගනු ලබන තීරණ අනුව කලින් කලට සංශෝධනය කළ හැකි වේ.

06.(2) ත්‍රිරෝද රථ පදවන්නා අයිතිකරු නම්, ඔහුගේ ද, පදවන්නා කුලී රියැදුරෙකු නම්, ඔහුගේ සහ අයිතිකරුගේ ද පහත සඳහන් ලේඛනවල ඡායාස්ථ පිටපත් අයදුම්පත සමඟ ඉදිරිපත් කළ යුතුය. එම අයදුම්පත තුන්වැනි උපලේඛනයේ සඳහන් පරිදි විය යුතුය :-

(i) ත්‍රිරෝද රථ හිමිකරුගේ ජාතික හැඳුනුම්පත හා වලංගු රියැදුරු බලපත්‍රය,
(ii) ත්‍රිරෝද රථයේ ලියාපදිංචි සහතිකය,
(iii) කුලී රියැදුරාගේ ජාතික හැඳුනුම්පත හා වලංගු රියැදුරු බලපත්‍රය.

06.(3) සභාවේ බලපත්‍ර ලත් ත්‍රිරෝද රථ සම්බන්ධ ලේඛනයක් පවත්වාගෙන යායුතු අතර, බලපත්‍රය අවලංගු කරනු ලැබූ විට ඒ බව සටහන් කර රතු තීන්තෙන් සලකුණු කළ යුතුය.

06.(4) සභාව විසින් මාසිකව හෝ ත්‍රෛමාසිකව හෝ වාර්ෂිකව හෝ ත්‍රිරෝද රථ නවතා තැබීම සඳහා බලපත්‍ර ලබා දිය හැක.

06.(5) වලංගු බලපත්‍රයේ ඡායා පිටපතක් පැහැදිලිව පිටතට පෙනෙන හෝ ත්‍රිරෝද රථයේ ඉදිරිපස වීදුරුවේ ප්‍රදර්ශනය කළ යුතුය.

06.(6) ත්‍රිරෝද රථයේ දකුණු පසින් මඟීන්ට නැගීම හෝ බැසීම කළ නොහැකි වනසේ අහුරා තිබිය යුතු ය.

06.(7) බලපත්‍රය ත්‍රීරෝද රථයෙහි ලියාපදිංචි හිමිකරු නමට නිකුත් කළ යුතු ය.

06.(8) බලපත්‍රයේ වලංගු කාල සීමාව අවසන් වීමට සති දෙකකට පෙර බලපත්‍රය අළුත් කරවා ගැනීම ත්‍රීරෝද රථ අයිතිකරු විසින් කළ යුතු ය.

06.(9) ඉහත 06.4 අනුඡේදය මාසිකව හෝ ත්‍රෛමාසිකව හෝ වාර්ෂිකව හෝ පනවා අය කළයුතු බලපත්‍ර ගාස්තුව සභාව විසින් තීරණය කළ යුතු අතර, එම තීරණ ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දිනයක හෝ එහි සඳහන් කරනු ලබන නිශ්චිත දිනයක සිට ක්‍රියාත්මක වන පරිදි අයකළ යුතු ය.

06.(10) 4 වැනි අතුරු ව්‍යවස්ථාව අනුව සභාව විසින් නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් ඇත්තේ නම් මිස ත්‍රීරෝද රථ නැවතුම් පළකට ත්‍රීරෝද රථයක් ඇතුළු කිරීම හෝ නවතා තැබීම නොකළ යුතු ය.

06.(11) නිකුත් කළ වලංගු බලපත්‍රයක් ඇත්තේ වුවද පොලිස් නිලධාරියෙකු විසින් හෝ සභාපතිවරයා හෝ ඔහු විසින් බලය දෙනු ලැබූ නිලධාරියෙකු විසින් තාවකාලිකව ත්‍රීරෝද රථ නැවතුම් පොළෙන් ත්‍රීරෝද රථ ඉවත් කිරීමට විධාන කළ හැකි අතර මෙම බලපත්‍ර ඊට බාධාවක් නොවිය යුතු ය.

07. නැවතුම් පොළක වෙනත් වාහන ඇතුළු කිරීම හෝ නවතා තැබීම නොකළ යුතු ය.

08. නැවතුම් පොළට ඇතුළුවන ස්ථානයට හෝ ඉන් පිටවන ස්ථානයට බාධාවන අයුරින් ත්‍රීරෝද රථ හෝ වෙනත් වාහන හෝ නවතා තැබීම නොකළ යුතු ය.

09. නැවතුම් පොළට ත්‍රීරෝද රථය ඉවත් කර ගැනීමේ කාර්යයට අදාළ යම් අළුත්වැඩියාවක් මිස, නැවතුම් පොළ ඇතුළත වෙනත් කිසිඳු ආකාරයක අළුත්වැඩියාවක් කිරීම නොකළ යුතු ය.

10. යම් ත්‍රීරෝද රථයක් නතරකර තැබීම සඳහා බලපත්‍රයක් ලබාගෙන ඇත්තේ යම් නැවතුම්පොළකට ද එම බලපත්‍රය අදාළ වන නැවතුම් පොළෙහි හැර වෙනත් කවර හෝ ස්ථානයක කුලී ගමනක් අපේක්ෂාවෙන් ත්‍රීරෝද රථයක් නවතා තැබීම නොකළ යුතු ය.

11. බලපත්‍රය හිමි ත්‍රීරෝද රථ නැවතුම් පොළක නතරකර ඇති අවස්ථාවේ දී සේවයේ යෙදී සිටින රියදුරන්, පිටස්තර පුද්ගලයන් ත්‍රීරෝද රථ නැවතුම් පොළට කැඳවා නිකරුනේ ගැවසීමට ඉඩදීම නොකළ යුතු ය.

12. නැවතුම් පොළක කවර හෝ තැනැත්තෙකු විසින් මත්ද්‍රව්‍ය භාවිතා කිරීම හෝ දුරාචාරයේ හැසිරීම හෝ වෙනත් කිසිඳු පීඩාකාරී ක්‍රියාවක් හෝ නොකළ යුතු අතර එවැනි ක්‍රියා කිරීම සඳහා ඉඩ නොදීමට නැවතුම් පළ භාවිතා කිරීමට අවසර ලද පුද්ගලයින්ගේ වගකීමක් වේ.

13. බලපත්‍රයක් හිමි කවර වූ හෝ තැනැත්තෙකු විසින් නැවතුම් පොළක විෂමාචාර ක්‍රියාවක නිරත වූ බවට ජනතාවගෙන් පැමිණිල්ලක් ලද අවස්ථාවක ඒ බව පරීක්ෂණයක් පවත්වා සනාථ වුවහොත් ඔහුගේ බලපත්‍රය අහෝසි කිරීමේ බලය සභාව සතු වේ.

14. සභාපතිවරයා හෝ ඔහු විසින් තත් කාර්යය සඳහා බලය පවරනු ලැබූ නිලධාරියෙකු හෝ පොලිස් නිලධාරියෙකු හෝ ඉල්ලා සිටි ඕනෑම විටෙක වලංගු බලපත්‍රයේ මුල් පිටපත් ත්‍රීරෝද රථයේ රියදුරු හෝ අයිතිකරු විසින් ඉදිරිපත් කළ යුතු ය.

15.(1) මේ අතුරු ව්‍යවස්ථාවල කවර වූ හෝ විධිවිධානයක් උල්ලංඝනය කිරීම වරදක් වන අතර, එකී වරද සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිරණයක් විසින් වරදකරු කිරීමෙන් පසු රුපියල් හත්සිය පනහක් නොඉක්මවන දඩයකට යටත් කළ හැකිය. එකී උල්ලංඝනය කිරීමේ වරද දිගින් දිගටම කරගෙන යන අවස්ථාවක, නිසි අධිකරණ බලයක් ඇති අධිකරණයක් විසින් වරදකරු කිරීමෙන් පසු හෝ එකී උල්ලංඝනය කිරීමේ වරද කෙරෙහි අවධානය යොමුකරන ලිඛිත දැන්වීමක් සභාපති විසින් හෝ තත් කාර්යය සඳහා ඔහුගෙන් බලයලත් නිලධාරියෙකු හෝ භාර කරනු ලැබීමෙන් පසු හෝ එකී වරද තවදුරටත් කරගෙන යනු ලබන සෑම දිනක් සඳහාම රුපියල් දෙසිය පණහක් නොඉක්මවන අතිරේක දඩයකින් දඬුවම් කරනු ලැබීමට යටත් වන්නේය.

15.(2) ඉහත 15(1) අතුරු ව්‍යවස්ථාවේ සඳහන් දඩ මුදල් සභාවේ පොදු අරමුදලට බැර විය යුතු ය.

16. මෙම ව්‍යවස්ථාවේ පටහැනිව කුමක් සඳහන් වුවද සභාවේ යෝජනා සම්මුතියක් මගින් මෙම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කොට අළුත් ව්‍යවස්ථාවක් සැකසීම හෝ අමතර අතුරු ව්‍යවස්ථාවන් සෑදීම කළ හැකි වන්නේය.

17. අර්ථ නිරූපණය

"සභාව" යන්නෙන් කළුතර ප්‍රාදේශීය සභාව ද,

"සභාපති" යන්නෙන් කළුතර ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා ද,

"සභාපති විසින් තත් කාර්යය සඳහා බලය පවරනු ලැබූ නිලධාරියෙකු" යන්නෙන් සභාපතිවරයා විසින් බලය පවරනු ලබන ප්‍රාදේශීය සභාවේ යම් නිලධාරියෙකු ද,

"සභාපති විසින් තත් කාර්යය සඳහා බලය පවරනු ලැබූ බලය ලත් නිලධාරියෙකු" යන්නෙන් සභාපතිවරයා විසින් ලිඛිතව බලය පවරනු ලැබූ ප්‍රාදේශීය සභාවේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු ද,

"බල ප්‍රදේශය" යන්නෙන් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත යටතේ සංස්ථාපනය කර ඇති කළුතර ප්‍රාදේශීය සභාවේ බල ප්‍රදේශයද,

"ත්‍රීරෝද රථය" යන්නෙන් කුලී ගමන් අපේක්ෂාවෙන් නවතා තබා ගන්නා වූ ත්‍රීරෝද රථයක් ද,

"කුලී රියැදුරකු" යන්නෙන් ත්‍රීරෝද රථය පදවන අයිතිකරු හෝ එම රථය පැදවීම සඳහා අයිතිකරු විසින් යොදවා ඇති අයද,

"නියමිත නැවතුම්පොළ" යන්නෙන් කළුතර ප්‍රාදේශීය සභාව විසින් යෝජනා සම්මුතියක් මගින් නිශ්චය කරනු ලැබූ ත්‍රීරෝද රථ නැවතුම් පොළද,

"නැවතුම්පොළ" යන්නෙන් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා විසින් බලපත්‍රයක් නිකුත් කරන ලද යම් නිශ්චිත නැවතුම්පළක්ද,

"මාසිකව" යන්නෙන් එක් එක් මාසය ආරම්භයේ පළමු වැනිදා සිට ඒ මාසයට අදාළ දින 28 හෝ දින 30 හෝ 31 කින් සමන්විත වූ මාසයකින් ද,

"ත්‍රෛයි මාසිකව" යන්නෙන් මාසිකව යන අර්ථකළනය මගින් දී ඇති දින ගණන ඇති ජනවාරි 01 වැනිදායින් ආරම්භව අනුයාත මාස 03 බැගින් දෙසැම්බර් 31 වැනිදා දක්වා ද,

"වාර්ෂික" යන්නෙන් වර්ෂයක ජනවාරි 01 වැනිදායින් ආරම්භව දෙසැම්බර් 31 වැනිදායින් අවසන් වන ලිත් වර්ෂයක් ද,

"පොලිස් නිලධාරියෙකු" යන්නෙන් 53 වැනි අධිකාරය වන 1865 අංක 16 දරන පොලිස් ආඥාපනතේ 104 වැනි වගන්තිය මගින් දී ඇති අර්ථකථනයම ද,

"වෙනත් වාහන" යන්නෙන් මෝටර් වාහන ආඥාපනත මගින් ඊට දී ඇති අර්ථකථනය ම ද,

"ලියාපදිංචි හිමිකරු" යන්නෙන් මෝටර් වාහන ආඥාපනත මගින් ඊට දී ඇති අර්ථකථන ම ද,

"පීඩාකාරී ක්‍රියාව" යන්නෙන් පීඩා ආඥාපනත මගින් ඊට දී ඇති අර්ථකථන ම ද අදහස් වේ.

18. මේ අතුරු ව්‍යවස්ථා සිංහල හා දෙමළ භාෂා පාඨ සම්බන්ධව යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

***පළමුවැනි උපලේඛනය***

*3.3 අතුරු ව්‍යවස්ථාව*

පත් කරනු ලබන මාර්ග කමිටුව පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය;

01. කමිටුවේ සභාපති ප්‍රාදේශීය සභාවේ සභාපති විය යුතු අතර, ලේකම් සභාවේ ආදායම් පරීක්ෂක වේ.

02. ප්‍රාදේශීය සභාවේ ලේකම් සහ කාර්මික නිලධාරී.

03. මාර්ග සංවර්ධන අධිකාරියේ විධායක ඉංජිනේරු හෝ ඔහු විසින් නම් කරනු ලබන නියෝජිතයෙකු.

04. පළාත් බඳ මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපති හෝ ඔහු විසින් නම් කරනු ලබන නියෝජිතයෙකු.

05. කළුතර මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ සභාපති හෝ ඔහු විසින් නම් කරනු ලබන නියෝජිතයෙකු.


06. කළුතර බස් කම්පැනි ලිමිටඩ් හි සභාපති හෝ ඔහු විසින් නම් කරනු ලබන නියෝජිතයෙකු.

07. සභා බල ප්‍රදේශයට අයත්, පොලිස් ස්ථානයන් හි රථ වාහන පොලිසියේ ස්ථානාධිපතිවරුන් හෝ ඔවුන් විසින් නම් කරනු ලබන නියෝජිතයෙකු.

08. සභා බල ප්‍රදේශය තුළ ඇති ත්‍රීරෝද රථ සංගම්වල නියෝජිතයෙකු.

*දෙවැනි උපලේඛනය*

*4 වැනි අතුරු ව්‍යවස්ථාව*




සෙ.මී. 13ක විෂ්කම්භය සහිත වෘත්තයකි.
ඇතුළත වෘත්තය නිල් පැහැයෙන් ද පිටත බෝඩරය කහ පැහැයෙන් ද යුත්
ප්‍රාදේශීය සභා ලාංඡනය සහිත ආකෘතියේ පරිදි කරුණු අඩංගු ස්ටිකරයකි.

*තුන්වැනි උපලේඛනය*

*6.2 අතුරු ව්‍යවස්ථාව*

**ත්‍රීරෝද රථ නැවතුම්පොළ බලපත්‍රයක් ලබා ගැනීම සඳහා අයදුම්පත්‍රය**

01. (i) අයදුම්කරුගේ නම :————.

(ii) ස්ථිර පදිංචි ලිපිනය :————.

(iv) වරිපනම් අංකය :————.

(v) ස්ථිර පදිංචියට අදාල පළාත් පාලන ආයතනය :————.

(vi) ජාතික හැඳුනුම්පත් අංකය :————.

02. (i) ත්‍රීරෝද රථ ලියාපදිංචි අංකය :————.

(ii) පදවන්නා අයිතිකරුද, නැත්නම් කුලී රියදුරු ද යන වග :————.

*(අ)* අයිතිකරුනම් වලංගු රියදුරු බලපත් අංකය :————.

*(ආ)* කුලී රියදුරෙකු නම් :————.

*(අ)* රියදුරුගේ නම :————.

*(ආ)* ස්ථිර පදිංචි ලිපිනය :————.

*(ඇ)* ජාතික හැඳුනුම්පත් අංකය :————.

*(ඈ)* වලංගු රියදුරු බලපත් අංකය :————.

03. බලපත්‍රය ඉල්ලුම් කරනු ලබන ත්‍රීරෝද රථ නැවතුම්පොළ :————.

04. බලපත්‍රය ඉල්ලුම් කරන කාලය : මාසික/මාස 03ට/අවුරුද්දකට

මා විසින් ඉහත සඳහන් කර ඇති තොරතුරු නිවැරදි බවත්, යම් හෙයකින් එම තොරතුරු සාවද්‍ය බව තහවුරු වුවහොත්, මාගේ ත්‍රිරෝද රථ නැවතුම්පොළ බලපත්‍රය පූර්ව දැනුම් දීමකින් තොරව අවලංගු කිරීමට යටත් බවත්, ප්‍රාදේශීය සභාව විසින් පනවා ඇති ත්‍රිරෝද රථ නැවැත්වීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ සඳහන් විධිවිධානයන් පිළිපැදීමටත් එකඟ වෙමි.

දිනය :- ............................................................ ............................................................

............................................................ අයදුම්කරුගේ අත්සන.

.................................................................................................................... මහත්මා/මහත්මියට ........................................................ ............................................. අංක දරන ත්‍රිරෝද රථය .......................................................................................... දරන නැවතුම් පොළෙහි නැවැත්වීම සඳහා බලපත්‍රය ................................................................................... කාලයකට ලබා දීම අනුමත කරමි.

දිනය :- ..........................................

සභාපති,
කළුතර ප්‍රාදේශීය සභාව.

10-326

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.